# කථා කරන දෑත්

SEDR
Supporting Effective Dispute Resolution
ඵලදායීව ආරවුල් නිරාකරණයට සහායවීම
பயனுறுதிமிக்க வகையில் பிணக்கை தீர்ப்பதற்கு ஆதரவளித்தல்

වැඩසටහනේ කොටස්කරුවන්
STRIDE
Funded by the European Union
ක්‍රියාත්මක කරනු ලබන්නේ
British Council
The Asia Foundation

විකල්ප ආරවුල් නිරාකරණය සඳහා කලාව (ARTS-4-ADR)

# කලාවේ නිහඬ බලය

## ශ්‍රී ලංකාවේ සංවාදය සහ ප්‍රතිසන්ධානය පෝෂණය කිරීමට කලාව යොදාගන්නා ආකාරය පිළිබඳ දෘශ්‍ය ගවේෂණයක්

පංචාලි ඉලන්කෝන් විසිනි

(2025)

# 02

# බලපෑම් තත්වයන්

**8617**

ප්‍රදර්ශනයට පැමිණි සංඛ්‍යාව

කලාව+විකල්ප ආරවුල් නිරාකරණය (ADR) වැඩමුළු

ප්‍රයෝජනවත් බව

100%

භාවිතා කිරීමට අදහස් කරයි


75%

විශේෂ නිර්මාණ කලා කෘති ගණන

**03**

**463**

වැඩමුළුවලට සහභාගීවන්නන්




මහජන වැඩසටහන් ගණන

**40**

**04**

සම්බන්ධවූ සංවිධාන

**30+**

විශේෂ පුද්ගලයන් සඳහා වැඩසටහන්

03

# යුක්තිය සඳහා කලාව අවශ්‍ය වන්නේ ඇයි

සාම්ප්‍රදායික පසුබිම්වල තම අදහස් ප්‍රකාශ කිරීමට බොහෝ විට අරගල කරන, ගැටුම්වලින් පීඩාවට පත් ප්‍රජාවන් යුක්තිය සඳහා ප්‍රවේශ වීමට දරන උත්සාහයන්වලදී  දෘශ්‍ය කලාව ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. කලාව මගින් විවිධත්වයන් අතර පාලම් තනන අතර ප්‍රජාවන්ට ඔවුන්ගේ ජීවිතයේ අත්දැකීම් විස්තර කිරීමට, අන්‍යයන්ගේ හැඟීම් තේරුම් ගැනීමට සහ ප්‍රතිසන්ධානය සඳහා ඇති ඉඩකඩ සිතුවම් කරමින් පොදු ගැටළු හඳුනා ගැනීමට හැකියාව ලැබේ.

ශ්‍රී ලංකාවට දරාගැනීමේ හැකියාව සහ සමාජ ඒකාබද්ධතාවය සඳහා කලාව භාවිතා කිරීමේ දිගු ඉතිහාසයක් ඇත. මෑත කාලීන උදාහරණය වන්නේ 2022 අරගලය ජනතා ව්‍යාපාරය වන අතර එහිදී දිවයින පුරා ප්‍රජාවන් දෘශ්‍ය කලා සහ කලාත්මක ප්‍රකාශනය ඇතුළු වෙනත් ක්‍රමවලින් වෙනසක් සහ යුක්තිය ඉල්ලා සිටියහ.

ප්‍රජා පැමිණිලිවලට මුල් හේතු පිළිබඳ සංවාදයක් ඇති කිරීම සහ ප්‍රජා පදනම් කරගත් විකල්ප ආරවුල් නිරාකරණ (ADR) යාන්ත්‍රණ භාවිතය පිළිබඳව දැනුවත් කිරීම සහ දිරිමත් කිරීම සඳහා කලාත්මක ප්‍රකාශනය මෙවලමක් ලෙස භාවිතා කිරීමට ඵලදායීව ආරවුල් නිරාකරණයට සහයවීමේ (SEDR) ව්‍යාපෘතිය මගින් විකල්ප ආරවුල් නිරාකරණය සඳහා කලාව (ART-4-ADR) ව්‍යාපෘතිය සංකල්පනය කරන ලද අතර ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය (MMCA) විසින් 2023 අගභාගයේ සිට 2025 වසරේ මුල් භාගය දක්වා ක්‍රියාත්මක කරන ලදී.

මෙම ව්‍යාපෘතිය යටතේ, විශේෂයෙන් නිර්මාණය කරන ලද කලා කෘති සහිත මහජන වැඩසටහන් සංවිධානය කරන ලද අතර සංවාද සහ පුරවැසි හවුල්කාරිත්වයන්ට දිරි දෙන ප්‍රජා වැඩමුළු ශ්‍රී ලංකාවේ උතුරු, නැගෙනහිර සහ ඌව පළාත්වල දිස්ත්‍රික්ක හයකදී පවත්වන ලදී.

# 04 කලා නිර්මාණවල නියමුවෝ

“විවිධ ප්‍රදේශවල විවිධ ප්‍රජාවන්හි කාන්තාවන් සමඟ මගේ මුලික සම්බන්ධවීම්වලින් පසු ඉඩම් ආරවුල් සම්බන්ධයෙන් ඔවුන් අතර බොහෝ සමානතා ඇති බව මට වැටහුණා. නිතර නිතර එවැනිම කතා අසන්නට ලැබුණු අතර, එම කාන්තාවන් සමඟ ඇති වූ හඳුනාගැනීම සංස්කරණයේදී මගේ සෞන්දර්යාත්මක තීරණවලට බලපෑමක් ඇති කළා.”

අනෝමා රාජකරුණා

## අනෝමා රාජකරුණා

### ඉඩම් අහිමි කඳුළු (2024)



අම්පාරේ ඉඩම් ආරවුල් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ අවතැන්වීම්

**කලාකරුගේ චරිතාපදානය:** අනෝමා රාජකරුණා යනු සුළුතර ප්‍රජාවන් පිළිබඳව වාර්තා කිරීම සම්බන්ධව ප්‍රකට සම්මානලාභී චිත්‍රපට නිෂ්පාදකවරියක්, සංස්කාරකවරියක් සහ ඡායාරූප ශිල්පිනියක් වන අතර ඇය කාන්තාවන් සහ ළමුන් කෙරෙහි සිය වැඩි අවධානය යොමු කරයි. ඇය ශ්‍රී ලංකාවේ සිනමා සඟරාවක ප්‍රථම කාන්තා සංස්කාරකවරිය වූ අතර 2015 වසරේ සිට යාපනය ජාත්‍යන්තර සිනමා උළෙල අධ්‍යක්ෂණය කළාය. 2011 වසරේ සිට ඇය Agenda 14 කෙටි චිත්‍රපට උළෙල ආරම්භ කර මෙහෙයවූ අතර ලොව පුරා සිනමා උළෙල 20 කට අධික සංඛ්‍යාවක විනිශ්චය මණ්ඩලයේ සාමාජිකාවක ලෙස කටයුතු කර ඇත. ඇය 1965 දී ශ්‍රී ලංකාවේ පානදුරේ උපත ලැබූ අතර කොළඹ පදිංචිව සිය කාර්යයන් හි නිරතවේ.

**කලා කෘතිය පිළිබඳ විස්තරය:** ඉඩම් අහිමි කඳුළු No More Land (2024) චිත්‍රපටය 1961 දී ගල්ඔය ව්‍යාපෘතිය අවසන් වීමෙන් පසු පිහිටුවන ලද අම්පාරේ මහා පරිමාණ මිනිස් ජනාවාසකරණය හේතුවෙන් සිදුවූ ඉඩම් ආරවුල් සහ අවතැන්වීම් පිළිබඳව විමර්ශනය කරයි. කාන්තාවකගේ දෘෂ්ටි කෝණයෙන් දිස්ත්‍රික්කයේ ඉතිහාසය වාර්තා කිරීමෙන්, ඉඩම් ආරවුල් වලදී බොහෝ විට නොසලකා හරිනු ලැබූ හඬවල් ඉස්මතු කරමින් පොදු ඉතිහාසය පිළිබඳව සමගාමී ප්‍රජාවන්ගේ අවධානය යොමු කරයි.

# 05

## හනුෂා සෝමසුන්දරම්

### භූමියේ අරගලය (2024)



තේ වතුවල ඉඩම් සහ නිවාස අයිතිවාසිකම්වල ව්‍යුහාත්මක අසමානතා

**කලාකරුගේ චරිතාපදානය:** කලකාරිනී හනුෂා සෝමසුන්දරම් මූලික වශයෙන් සිතුවම් සහ ස්ථාපනයන් සමඟ සිය කලා කටයුතු සිදු කරන අතර 2014 වර්ෂයේදී යාපනය විශ්ව විද්‍යාලයෙන් කලා හා නිර්මාණකරණය පිළිබඳ ලලිත කලා ශාස්ත්‍රවේදී උපාධියක් ලබා ඇත. ඇයගේ කෘති ජාතික මට්ටමෙන් (ටේස්ට් ඔෆ් ටී - යාපනය/කොළඹ 2013, එම්බෝඩින් පවර් -කොළඹ 2013,රිකරන්ස් කොළඹ 2020) සහ ජාත්‍යන්තර මට්ටමෙන් (සෆර් - ඇෆ්ගනිස්ථානය 2015, ඩකා කලා සමුළුව - බංග්ලාදේශය 2016) ප්‍රදර්ශනය කර ඇත. ඇය 1988 දී ශ්‍රී ලංකාවේ හැටන් නගරයේ උපත ලබා එහි ජීවත් වෙමින් සිය කාර්යයන්හි නිරතවේ.

**කලා කෘතිය පිළිබඳ විස්තරය:** මිශ්‍ර මාධ්‍ය ස්ථාපනය මගින් (භූමියේ අරගල - Shifting Lands) (2024) දැලක ආකාරයෙන් සකස් කරන ලද තේ බෑග් මත සංකීර්ණ චිත්‍ර ඉදිරිපත් කරයි. නිර්මාණය කර තිබූ දැල වතු ප්‍රජාවන්ගේ ලයිම් කාමර නිරූපණය කළේය. වතු ප්‍රජාවගේ නිවාස කඩාකප්පල් කරමින් අලුතින් ඉදිකරන ලද මාර්ගය මෙම ප්‍රජාවගේ ජීවිතවලට බාධා කරන අතර වතු ප්‍රජාවන්ට වැදගත් වන වෙනත් ප්‍රවේශ මාර්ගයක් වතු පාලනාධිකාරිය විසින් දශක ගණනාවක් තිස්සේ නොසලකා හැර නඩත්තු කර නොමැත. වසර 200 කට අධික කාලයක් තිස්සේ වතු ප්‍රජාවන් යටිතල පහසුකම් සංවර්ධනය තුළදී මුහුණ දුන් ඉඩම් අරගල තේ බෑග් මත ඇඳී චිත්‍ර 200 කින් සටහන් කර ඇති අතර, එය වතු කම්කරුවන් ආන්තිකකරණයට ලක්ව ඇති ආකාරය සහ ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිබඳ දෘශ්‍ය ලේඛන රැස් කිරීමකි..

## ජැස්මින් නිලානි ජෝසප්

### ඩී එස්ගේ පොරොත්තු කාමරය (2024)



ඉඩම් නැවත පවරා දීමේ ප්‍රතිසන්ධාන ක්‍රියාවලියේ නිළධාරීවාදය සහ එකතැන පල්වීම.

**කලාකරුගේ චරිතාපදානය:** දෘශ්‍ය කලාකරු ජැස්මින් නිලානි ජෝසප් උතුරු ශ්‍රී ලංකාවේ අවතැන්වීම්, මිලිටරිකරණය සහ එදිනෙදා ජීවිතය පිළිබඳව සිය ආඛ්‍යානයන් හරහා ගවේෂණය කරයි. 2022 වර්ෂයේදී DBF ඒෂියා ආර්ට් ෆියුචර් සම්මානය දිනාගත් ඇයගේ කෘති ජාතික මට්ටමෙන් (මානව හිමිකම් කලා උළෙල, කොළඹ, 2017; කුඩා කතා ලක්ෂයක්, කොළඹ, 2019; කලම්බෝස්කෝප්, ශ්‍රී ලංකා, 2019) සහ ජාත්‍යන්තර මට්ටමෙන් (ශක්තිමත් රාජ්‍යයක කලාකරුවන් සඳහා ප්‍රකාශනය, ජර්මනිය, 2020; කොච්චි බෙනාලේ පදනම, ඉන්දියාව, 2020; 10 වැනි ආසියා පැසිෆික් ත්‍රෛවාර්ෂිකය, ඕස්ට්‍රලියාව, 2022) ආදියෙහි ප්‍රදර්ශනය කර ඇත. ඇය 1990 වසරේදී ශ්‍රී ලංකාවේ යාපනය දිස්ත්‍රික්කයේ උපත ලබා එහි ජීවත් වෙමින් සිය කාර්යයන්හි නිරත වේ.

**කලා කෘතිය විස්තරය:** ඩීඑස්ගේ පොරොත්තු කාමරය- DS Waiting Room (2024) යනු ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල DS& පොරොත්තු කාමර බංකු සහ ආරවුල් සම්බන්ධ ලිපි ගොනු ආදිය ප්‍රතිනිර්මාණය කරන ස්ථාපනයකි. යුධ සමයේදී ඉඩම් අහිමි වූ හෝ අැඳාගත් හෝ අත්පත් කරගත් වවුනියාව සහ මන්නාරම දිස්ත්‍රික්කවල ප්‍රජාවන්ගේ කථා මෙහි සටහන් වේ. නිලානි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රැඳී සිටි ඇගේ ළමා කාලයේ අත්දැකීම් සිහිපත් කරමින් ඉඩම් ආරවුල් ඇති පුද්ගලයින් මුහුණ දෙන නිළධාරීවාදී ප්‍රමාදයන් පිළිබඳව ප්‍රේක්ෂකයාගේ අවධානය යොමු කරවයි.

# 06

විකල්ප ආරවුල් නිරාකරණය (ADR) පුහුණු පැය ගණන | 48

අන්තර් පළාත් ක්ෂේත්‍ර චාරිකා | 06

යාපනය | මන්නාරම | හැටන් | බදුල්ල | මොණරාගල | අම්පාර

කොළඹ නේවාසික වූ මාස ගණන | 03

කොළඹ දී පහසුකම් සැලසූ මහජන වැඩමුළු | 12

කලාව (Art) + විකල්ප ආරවුල් නිරාකරණය (ADR) ඒකාබද්ධ පාඩම් සැලසුම් | 03

උතුර, නැගෙනහිර සහ ඌව යන පළාත්වල පහසුකම් සැපයූ ප්‍රාදේශීය වැඩමුළු | 15

# ශිෂ්‍යත්වලාභීන්



## තමිළිනී සිත්ත්‍රිවඩිවේල්

තම්ළිනී අධ්‍යක්ෂකවරියක්, චිත්‍රපට නිෂ්පාදකවරියක්, කලාකාරිනියක් සහ සමාජ යුක්තිය වෙනුවෙන් කටයුතු කරන ක්‍රියාකාරිනියක් වන අතර ඇය සමාජ ගැටලු තම ආඛ්‍යානවලට ගෙනීම සඳහා සිනමාව සහ රංග කලාව භාවිතා කරයි. ඇයගේ කාර්යයේදී සමාජ සහජීවනය සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය යන තේමාවන් ගවේෂණය කරන ඇය මානව හිමිකම් සහ කාන්තා සවිබල ගැන්වීම සඳහා දැඩිව පෙනී සිටියි. වඩාත් අන්තර්කරණය වූ අනාගතයක් සඳහා ප්‍රජාවන් සම්බන්ධ කර ගැනීම සඳහා තම්ළිනී ඇයගේ වේදිකාව භාවිතා කරයි. ඇය ශ්‍රී ලංකාවේ මඩකලපුව දිස්ත්‍රික්කයේ පදිංචිව සිටී.



## කල්‍යානි සුන්දරලිංගම්

කල්‍යාණි යනු කාන්තා සවිබල ගැන්වීම සහ තරුණ ක්‍රියාකාරිත්වය වෙනුවෙන් කැපවී සිටින රංගන ශිල්පිනියක සහ ප්‍රජා සේවිකාවකි. ඇය 2013 වසරේ සිට සූරිය කාන්තා සංවර්ධන මධ්‍යස්ථානයේ වැඩසටහන් නිළධාරිනියක ලෙස සේවය කර ඇති අතර වසර 18කට වැඩි කාලයක් සූරිය තරුණ කාන්තා සංස්කෘතික කණ්ඩායමේ ක්‍රියාකාරී සාමාජිකාවකි. සමාජ ගැටුම්, ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිලිබඳ ගැටලු සහ පාලනය ආදී තත්ත්වයන් ආමන්ත්‍රණය කිරීම සඳහා ඇය සිය කලාත්මක ප්‍රකාශනය භාවිතා කරයි. ඇය ශ්‍රී ලංකාවේ මඩකලපුව දිස්ත්‍රික්කයේ පදිංචිව සිටී.



## බවනීධා ලෝගනාදන

බවනීධා යනු සිනමාව සහ සජීවිකරණය තුළින් ආන්තිකකරණය වූ කණ්ඩායම්වල විශේෂයෙන් භූමියක් අහිමි ප්‍රජාවන්ගේ හඬ නඟා සිටුවීම සඳහා කැපවී සිටින ස්වාධීන චිත්‍රපට නිෂ්පාදකවරියක් සහ සංස්කෘතිය පිලිබඳ වෘත්තිකයෙකි. ඇයගේ චිත්‍රපට ළමා අපයෝජන, ලිංගික ජාවාරම් සහ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පදනම් වූ ප්‍රචණ්ඩත්වය වැනි සංවේදී මාතෘකා ස්පර්ශ කරයි. ඇයගේ කාර්යය ඌව දිස්ත්‍රික්කයේ අඩු වරප්‍රසාද ලත් සුළුතර කණ්ඩායම් සහ  විශේෂයෙන් මොනරාගල රබර් වතු සමාජය කෙරෙහි ද අවධානය යොමු කරයි. මන්ද, ඇයගේ පවුලේ මූල බීජයන් මොනරාගල දිස්ත්‍රික්කයේ මෙම ප්‍රජාවන් සමග බැඳී ඇති බැවිනි. බවනීධා ශ්‍රී ලංකාවේ කොළඹ දිස්ත්‍රික්කයේ පදිංචිව සිටී.

"මේ ශිෂ්‍යත්වය මගේ කලාත්මක ප්‍රවේශය සැබවින්ම පුළුල් කළා. ස්ථාපන කලාව වැනි චිත්‍රපටයෙන් ඔබ්බට ගිය කලා ආකෘති ප්‍රජාවන්ට කෙතරම් ගැඹුරින් බලපෑම් කළ හැකිද යන්න මට ඉගැන්නුවා. විවිධ ප්‍රදේශවලට යාම, මිනිසුන් සමඟ සම්බන්ධ වීම සහ ඔවුන්ගේ කථා වලට සවන් දීම ඔවුන්ගේ අරගල පිටුපස ඇති සංස්කෘතික සන්දර්භයන් තේරුම් ගැනීමට මට උපකාරී වුණා. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මෙම ප්‍රජාවන් සහ ඔවුන්ගේ දුක්ගැනවිලි කෙරෙහි අවධානය යොමු කරමින්, ඔවුන්ගේ කථා බෙදාගැනීම සහ කාන්තාවන් මෙන්ම ප්‍රජාව සවිබල ගැන්වීම අරමුණු කරගත් නව චිත්‍රපට ව්‍යාපෘති දෙකක් නිර්මාණය කිරීම සඳහා මම දැන් කටයුතු කරමින් සිටිනවා."

**බවනීධා ලෝගනාදන්**

# 08







# කලා කෘති

## ඉඩම් අහිමි කඳුළු

අනෝමා රාජකරුණා

## ඩීඑස්ගේ පොරොත්තු කාමරය

ජැස්මින් නිලානි ජෝසප්

## භූමියේ අරගලය

හනුෂා සෝමසුන්දරම්

09

# වර්ණ ගැන්වූ ප්‍රකාශන මහජන ප්‍රදර්ශනය

## නොමිලේ මහජන වැඩසටහන

ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය (එඑක්) විසින් පවත්වනු ලද 1000කට අධික පිරිසකගේ සහභාගීත්වයෙන් ප්‍රදර්ශන චාරිකා, ශිෂ්‍යත්-වලාභීන් විසින් මෙහෙයවන ලද වැඩමුළු සහ විශේෂ නිර්මාණ කරන ලද කලාකරුවන් තිදෙනාගේ කතා ඇතුළත් මහජන වැඩසටහන් 40 ක් නොමිලේ පැවැත්විය. මෙම වැඩසටහනේදී කලාකෘති දෘශ්‍ය ආඛ්‍යාන වශයෙන් ඉදිරිපත් කළ අතර ඒවා ආරවුල්, ප්‍රතිපත්තිමය මැදිහත්වීම් හා සාකච්ඡා සඳහා උත්ප්‍රේරකයක් වශයෙන් ඉදිරිපත් කෙරිණි.

## යාපනය සහ අම්පාර දිස්ත්‍රික්කවල මහජන කලා කෘති ප්‍රදර්ශනය

ඩීඑස්ගේ පොරොත්තු කාමරය - (DS Waiting Room) සහ ඉඩම් අහිමි කළුඑ (No More Lands) යන කලා කෘති යාපනයේ "කාලම්" හිදී ප්‍රදර්ශනය කළේය.

ඉඩම් අහිමි කළුඑ (No More Lands) අම්පාරේ දිරිය කාන්තා සංවර්ධන පදනමේදී ප්‍රදර්ශනය කළේය.

## බිම් පෙරළිය ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය (MMCA) කොළඹ (2024 සැප්තැම්බර් - 2025 ජනවාරි)

විශේෂ නිර්මාණ කරන ලද කලා කෘති තුනක් ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරයෙහි බිම් පෙරළිය (Total Landscaping) ප්‍රදර්ශනයෙහි අනෙකුත් කෘති සමඟ ප්‍රදර්ශනය කරන ලදී.

## විශේෂ පුද්ගලයන් සඳහා වැඩසටහන්

බිම් පෙරළිය (Total Landscaping) සඳහා පුද්ගලික චාරිකාවක් ඉහළ පෙළේ ප්‍රතිපත්ති සම්පාදකයින් සහ රාජ්‍ය තාන්ත්‍රිකයින් 76 දෙනෙකු සඳහා පවත්වන ලද අතර මේ සඳහා ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාර සත්කාරකත්වය ලබා දුන්නේය.

**91.2%**

ඉඩම් සම්බන්ධ ගැටළු පිළිබඳ වැඩිදියුණු වූ අවබෝධයක් ඇති බව වාර්තා කර ඇත.

**87.3%**

මෙම සැසිවලින් ලබාගත් දැනුම ඔවුන්ගේ වෘත්තිමය කටයුතුවලදී බොහෝදුරට දායක කරගන්නා බව සඳහන් කර ඇත.

**"චිත්‍ර කලා ප්‍රදර්ශනයක් පිළිබඳව කතා කිරීමේදී බොහෝ දුරට එය 'මිලදීගැනීම' හෝ 'එකතුවක්' යන දෘෂ්ටිකෝණයෙන් බැලීමට නැඹුරුතාවයක් දක්වනවා. නමුත් වැදගත් මාතෘකා පිළිබඳව දැනුවත්භාවය වැඩි කිරීමටත්, ආරක්ෂිත වටපිටාවක් සඳහා සංවාදයන් ගොඩනැංවීමටත් මෙය කදිම මාර්ගයක් වනවා"**

# 10 පුනරාවර්තිත ව්‍යුහගත සංවාද වැඩමුළු

## නැගෙනහිර







## උතුර









## ඌව







# ප්‍රාදේශීය වැඩමුළු

**ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය (MMCA) විසින් උතුරු, නැගෙනහිර සහ ඌව පළාත්වල දිස්ත්‍රික්ක 8ක කලාව පදනම් කරගත් ප්‍රාදේශීය වැඩමුළු 15 ක් පවත්වා ඇත. - යාපනය, මන්නාරම, වවුනියාව, ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර, මොණරාගල සහ බදුල්ල.**

### වැඩමුළු සඳහා ප්‍රජා නායකයින් සහ ක්‍රියාකාරීන් සම්බන්ධ විය.

සමථ මණ්ඩල කොමිෂන් සභාවේ සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල නියෝජිතයින්, තරුණ තරුණියන්, ආගමික නායකයින්, ග්‍රාමීය සංවර්ධන කණ්ඩායම්, කාන්තා සංවිධාන, සමාජ සේවකයින්, ගුරුවරුන් සහ වතු කම්කරුවන් ඇතුළු ප්‍රජා නායකයින් සහ ක්‍රියාකාරීන් මෙම වැඩමුළුවලට සහභාගී විය.

**58.6%** **කාන්තාවන්**

වැඩමුළු සඳහා 450කට අධික පිරිසක් සහභාගී විය

වැඩමුළුවලදී සහභාගිවන්නන් විශේෂයෙන් නිර්මාණය කරන ලද කලා කෘති සමඟ සම්බන්ධ වූ අතර කලා කෘතියේ ඔවුන්ගේ ජීවන අත්දැකීම්වලට අදාළ වූ අංශ පිළිබිඹු කළේය. සහභාගිවන්නන් තමන්ට අදාළ වන පොදු කරුණු සහ පොදුතාවයන් පිළිබඳව සාකච්ඡා කළ අතර ඒ පිළිබඳව උපකල්පන සහ ඉදිරි දර්ශන ඉදිරිපත් කළේය.

ශිෂ්‍යත්වලාභීන් ගැටුම් නිරාකරණ පිළිබඳ සාකච්ඡාව සකස් කරගන්නේ කෙසේද යන්න පිළිබඳව සහභාගිවන්නන්ට ඉගැන්වීම සඳහා ඔවුන්ගේ කලාව පදනම් කරගත් විකල්ප ආරවුල් නිරාකරණය (ADR) පිළිබඳ පාඩම් සැලසුම් භාවිතා කළේය.

# අදහස්

"අපි බොහෝ විට ආරවුල්වලට කෙලින්ම පිවිසීම එතරම් ඵලදායී වන්නේ නැහැ. විශේෂයෙන් හැඟීම් ප්‍රබල වූ විට. කෙසේ වෙතත්, සෘජු බවෙන් තොරව හා සංවේදී ප්‍රශ්න ඉදිරිපත් කිරීම තුළින් වඩාත් සාර්ථක ලෙස සංවාද ගොඩනගාගත හැකි ආකාරය මෙම වැඩමුළුවෙන් අපට පෙන්වා දුන්නා. මෙහිදී අදාළ පාර්ශවයන්ට සවන්දෙන බවක් සහ ඔවුන් වඩාත් විවෘත බවක් ගැටළු නිරාකරණදී පෙන්වයි " - ජස්ටිස් ෆෝ පීපල් සංවිධානයේ නිලධාරියෙක්, වෙඩ්ඩිකුලම්.

"ඇත්ත වශයෙන්ම, ගැටුමක් සෘජුවම විසඳීම, ඊට සම්බන්ධ අය සොයා ගැනීම හෝ විකල්ප මාර්ග සොයාගැනීම අභියෝගාත්මකයි. කෙසේ වෙතත්, සංවාද සඳහා ව්‍යුහාත්මක මාධ්‍යයක් ලෙස කලාව යොදා ගැනීම විශිෂ්ට ප්‍රවේශයක් ලෙස මම විශ්වාස කරනවා"

වැඩමුළුට සහභාගීවුවෙක් (MMCA අවසන් වාර්තාව)

"අපගේ අත්දැකීම් බෙදාගැනීමෙන්, අපගේ ගැටලු එකිනෙකට සම්බන්ධ වී ඇති ආකාරය මම දැක්කා. කලාවට නව ආකාරවලින් මිනිසුන් සම්බන්ධ කරගත හැකි ආකාරය ද මට වැටහුණා." - වැඩමුළුට සහභාගීවුවෙක් අම්පාර.

"අනෝමාගේ ඉඩම් අහිමි කඳුළු (No More Lands) චිත්‍රපටය දැකීම මගේ ජීවිතයේ ප්‍රතිබිම්බයක් දුටුවා හා සමානයි. එය මට ලේසියෙන් කියන්න බැරි දේවල් ඉතා හොඳින් පෙන්නුවා." - වැඩමුළුට සහභාගීවුවෙක්, අම්පාර.

# 13

# ඉදිරි දැක්ම

කලාත්මක/නිර්මාණාත්මක ප්‍රකාශනය මඟින් යුක්තිය සඳහා ප්‍රවේශයන් වැඩි දියුණු කරයි. විශේෂයෙන්ම, මේ හරහා ආන්තික සහ ගැටුම්වලින් පීඩාවට පත් වූවන් සඳහාත් විධිමත් යුක්ති පද්ධතීන් කෙරෙහි විශ්වාසයක් නොමැති ප්‍රජාවන් සඳහාත් සංවේදනය ගොඩනැගීමට ඉඩ සලසයි.

කලාත්මක ප්‍රකාශනය සෑම විටම උපදේශනමය නොවන ආකාරයෙන් ප්‍රජාවන්ට දුක්ගැනවිලි ප්‍රකාශ කිරීමට, බෙදා ගැනීමට ඉඩ සලසමින් බෙදී වෙන්වී ගිය කණ්ඩායම් අතර සංවේදනය ගොඩනැංවීමට ඉඩ සලසයි.

කලාව, යුක්තිය සහ සංවර්ධන අංශ අතර සම්බන්ධතා ශක්තිමත් කිරීම තුලින් යුක්තිය පිලිබඳ වැඩසටහන් සමඟ නිර්මාණාත්මක ප්‍රකාශනය ඒකාබද්ධ කිරීමට උපකාරී වේ. දැනුම බෙදාගැනීමෙන් සහ හොඳින් වැඩ කරන දේ පෙන්වීමෙන්, කලාකරුවන්ට සහ සංවර්ධන සේවකයින්ට එකිනෙකාගෙන් ඉගෙන ගෙන සාර්ථක අදහස් පුළුල් කළ හැකිය.

ප්‍රාදේශීය නායකයින් සහ වෘත්තිකයන් සවිබල ගැන්වීම සහ ශක්තිමත් කිරීම සඳහා දිගුකාලීන උපදේශන මුලපිරීම්වලට ආයෝජනය කිරීම, ඉගෙනීම සහ ඔවුන්ගේ ප්‍රජාවන් තුළ දැනුම බෙදා හැරීම හරහා තිරසාර බව සහතික කිරයි.

කලාත්මක ප්‍රවේශයන්ගෙන් යුක්තිය වෙනුවෙන් වැඩසටහන් නිර්මාණය කිරීම ප්‍රාදේශීය සංස්කෘතිය හා ප්‍රජා ගැටලු මනාව පිළිබිඹු කරන අතර, නිර්මාණ ක්‍රියාවලියට ප්‍රජාව සම්බන්ධ කර ගැනීම තුළින් විශ්වාසය ගොඩනැගීමටත්, ඉදිරිපත් කරන කථා සඳහා ප්‍රජාව තුළ වගකීමක් ඇති කිරීමටත් උපකාරී වේ.

කලාව, යුක්තිය සහ ප්‍රජා සංවර්ධනය සම්බන්ධ වැඩසටහන් සඳහා බහුවිධ දායකයන්ගෙන් අරමුදල් ලැබීම තුළින් වැදගත් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම සහතික කෙරේ. කලාව නිතිපතා සහ සැලසුම් සහගතව යොදා ගැනීමේදී එමඟින් මෙම ගැටළු අමතක වී යාම වෙනුවට ජනතාවට ඔවුන්ගේ විඥානයේ තබා ගැනීමටත් ඒ පිළිබඳව කතා කිරීමටත් උපකාරී වේ.

සිද්ධි අධ්‍යයන වාර්තාව
මෙතැනින් ලබා ගත හැක

SEDR
Supporting Effective Dispute Resolution
ඵලදායීව ආරවුල් නිරාකරණයට සහායවීම
பயனுறுதிமிக்க வகையில் பிணக்கை தீர்ப்பதற்கு ஆதரவளித்தல்


වැඩසටහනේ කොටස්කරුවන්

STRIDE

Funded by the European Union

ක්‍රියාත්මක කරනු ලබන්නේ

BRITISH COUNCIL

The Asia Foundation

මෙම ප්‍රකාශනය යුරෝපා සංගමයේ මූල්‍ය අනුග්‍රහය ඇතිව ඉදිරිපත්කිරීමකි. එනමුත් එහි අන්තර්ගතය SEDR හි වගකීමක් වන අතර, එය යුරෝපා සංගමයේ අදහස් අවශ්‍යයෙන්ම පිළිබිඹු නොකරයි.